# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1894/3 - 2014 දෙසැම්බර් මස 22 වැනි සඳුදා - 2014.12.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (1) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකාවේ ජල මූලාශ්‍ර, ඒවායේ පෝෂක ප්‍රදේශ හා රක්ෂිත ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

2013.02.07 දින පැවැත්වූ ඉඩම් හා ඉඩම් සංවර්ධන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව විසින් පත් කරන ලද අනුකමිටුව විසින් සකස් කරන ලදුව, 2014.05.20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ ජල මූලාශ්‍ර, ඒවායේ ජල පෝෂක ප්‍රදේශ හා රක්ෂිත ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ටී. අශෝක පීරිස්,
ලේකම්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාතශාංශය.

2015 ජනවාරි මස 07 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", 1200/6,
ඉඩම් මහලේකම් කාර්යාලය,
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

01. හැඳින්වීම (Introduction)

1.1 ජලය, ශ්‍රී ලංකාව සතු ප්‍රධානතම ස්වභාවික සම්පතක් වන අතර එය අතීතයේ පටන්ම මෙරට ආර්ථික සංවර්ධනයට දායකවන ප්‍රධානතම සාධකයක් ද වේ. කෘෂිකාර්මික රටක් වූ ශ්‍රී ලංකාව අතීතයේ සිට අද දක්වා ම විවිධාකාර වූ වාරි කර්මාන්ත තුළින් මෙරට කෘෂි ආර්ථිකයට ලබා දී ඇති දායකත්වය සුවිශේෂී එකකි. ඒ හැරුණුකොට කර්මාන්ත, සේවා සැපයීම, පානීය ජල අවශ්‍යතා පමණක් නොව විනෝදාස්වාදක කටයුතු හා සංචාරක කර්මාන්තයටත්, ජල විදුලිය නිෂ්පාදනයටත් ශ්‍රී ලංකාවේ ජල සම්පත ඉතා වැදගත් මූලාශ්‍රයක් බවට පත්වී තිබේ. 21 වැනි සියවසට උචිත නව ආර්ථික චින්තනයක් ඔස්සේ සංවර්ධන මගකට අවතීරණ වී ඇති ශ්‍රී ලංකාවේ ජල සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් නව උපයා මාර්ගික ප්‍රවේශයක අවශ්‍යතාවයද ජාතික සංවර්ධන සැළසුම් හා න්‍යාය පත්‍රයන්හි අන්තර්ගත වී තිබේ. (Mahinda Chinthanaya : Vision for a New Sri Lanka - A Ten Year Horizen Development Framework 2006 - 2016, Pages 202 - 204).



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1.2 ශ්‍රී ලංකාව ප්‍රධාන ගංගා ද්‍රෝණි 103කින් සමන්විත රටකි. මෙම ගංගාවලින් 20ක් පමණ වර්ෂය පුරා ගලන ගංගා වන අතර ඉතිරිය කාලීන ගංගා ගණයට අයත් වේ. විශාලත්වය අනුව ගංගා ද්‍රෝණිවල ප්‍රමාණය ද වෙනස්වන අතර එය වර්ග කිලෝමීටර් 10 සිට 10,000 දක්වා වෙනස් වේ. භූගෝලීය වශයෙන් සලකා බලන විට ගංගා ද්‍රෝණිවලට අයත් බිම් ප්‍රමාණය ශ්‍රී ලංකාවේ සමස්ථ බිම් ප්‍රමාණයෙන් 90%ක් පමණ වේ.

1.3 ශ්‍රී ලංකාවේ විශාල ස්වාභාවික ජලාශ නොමැති වුවද විවිධ පරිමාණ නිර්මිත වැව් හා වාරි ඇළ පද්ධතියකට හිමිකම් කියනු ලබයි. සමහර වැව් මීට ශතවර්ෂ ගණනාවකට පෙර ඉදිකර ඇති අතර වර්තමාන තත්ත්වයට ප්‍රතිසංස්කරණය කර ඇත. මේවන විට වැව් 14,000ක් පමණ වියළි කලාපීය ප්‍රදේශවල ව්‍යාප්තව ඇති අතර විශාලත්වය අනුව හෙක්ටයාර් 1 සිට 6500 දක්වා විවිධ වේ. කෙසේ වුවද වැඩි වැව් ප්‍රමාණයක් හෙක්ටයාර් 300ට ව වඩා විශාලත්වයෙන් අඩුය.

1.4 එමෙන්ම වියළි කලාපීය ප්‍රදේශ වල වැව් කිහිපයක් එකිනෙකට සම්බන්ධ වීමෙන් එල්ලංගාව පද්ධති ද (Cascade) ශ්‍රී ලංකාවේ ජලසම්පත් සංරක්ෂණයේදී ඉතාමත් වැදගත් සංරචකයක් වේ.

1.5 ඉහත දක්වන ලද ජල මූලාශ්‍ර වලට අමතරව ඇති විශාල ජල උල්පත් ප්‍රමාණයක් දිවයින පුරා ව්‍යාප්තිව පවතී. නිදසුනක් ලෙස නුවරඑළිය දිස්ත්‍රික්කයේ මෙබඳු ජල උල්පත් 1544ක්ද, මහනුවර දිස්ත්‍රික්කයේ 204ක්ද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ 319ක්ද, මොණරාගල දිස්ත්‍රික්කයේ 210ක්ද, මාතලේ දිස්ත්‍රික්කයේ 288ක්ද වාර්තා වී ඇති අතර සමස්ථ දිවයිනේ මේ වන විට හඳුනාගෙන ඇති ජල උල්පත් ගණන 3540කි.

1.6 මේ හැරුණු විට දිවයිනේ වියලි කලාපීය ප්‍රදේශ වල පොළෝ අභ්‍යන්තර හුණු ගල් ස්ථර අතර පිහිටි භූගත ජලනිධි ද ශ්‍රී ලංකාවේ ජල මූලාශ්‍ර අතර ප්‍රධාන ස්ථානයක් ගනී. පානීය ජල අවශ්‍යතාවයන් හා කෘෂිකාර්මික ජල අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා මෙම ජලනිධි සැලකිය යුතු කාර්යභාරයක් ඉටුකරයි.

1.7 පොදුවේ එහෙත් පුළුල්ව සලකා බල විට "ජල මූලාශ්‍ර" යන්න පිළිබඳ නිර්වචනයන් විමසීමේ දි ගංගා, ඇළ, දොල, ජලාශ හා ජල පෝෂක, ජල උල්පත් හා තෙත් බිම් පමණක් නොව අයිස් කඳු, හිම පතනයන්, වායුගෝලීය ජල වාෂ්ප, වලාකුළු හා ටොනෙඩෝ (Tonedo) හෙවත් "දියගොබ වළාවන්" ද ඇතුළත් වේ. එසේ වුවද ශ්‍රී ලංකාවේ ජල මූලාශ්‍ර සංරක්ෂණය හා ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රධාන සංරචකයන් 03ක් එහි වැදගත්කම අනුව මෙම ප්‍රතිපත්තිය සැකසීමේදී සැළකිල්ලට ගනු ලැබේ. ඒවා පහත දැක්වේ.

(අ) ගංගා, ඇළ, දොළ සහ ඒවායේ රක්ෂිත හා එම ගංගා ආරම්භක ස්ථාන ඇතුළත් ක්ෂුද්‍ර ජල පෝෂක ප්‍රදේශ හා (micro catchments) ගංගාවල පිටාරතැනි ;

(ආ) ස්වාභාවික හෝ කෘත්‍රීම වැව් හා ජලාශ හා විල්ලු, ඒවායේ රක්ෂිත හා එම වැව් සහ ජලාශවල "සමීපතම පෝෂක ප්‍රදේශ" (Immediate Catchments) සහ වාරි ඇළමාර්ග සහ ඒවායේ රක්ෂිත ;

(ඇ) භූගත ජලනිධි හෝ භූ තල ජල උල්පතක් හෝ දිය බුබුලක් හෝ එබඳු පොදු පරිහරණයක් සඳහා විභවතාවයක් ඇති ස්ථානයක් හා එහි පැවැත්ම තහවුරු වීමට අවශ්‍ය රක්ෂිත සීමාවක්.

1.8 ඉහත සඳහන් ජල මූලාශ්‍රවල තිරසාර පැවැත්ම තහවුරු වීම සඳහා ඒවායේ පෝෂක ප්‍රදේශ, ප්‍රභව ප්‍රදේශ හා රක්ෂිතයන්ගෙන් සිදුවන මෙහෙය ඉතාමත් වැදගත් වේ. විශේෂයෙන්ම ගංගාවන් පෝෂණය වන ඉහළ උන්නතාංශවල පිහිටි ක්ෂුද්‍ර ජල පෝෂක ප්‍රදේශ (micro catchments) වැව් හා ජලාශ වල ධාරා ප්‍රදේශ, ගංගා, ඇළ, දොළ වලට අයත් රක්ෂිත හා පිටාර තැනිවලට අයත් ජල ගැළුම් නිම්න ප්‍රදේශ ශ්‍රී ලංකාවේ ජල මූලාශ්‍ර පෝෂණය වන ප්‍රභවයන් වන අතර ඒවායේ ගැලීම් රටාව හා තිරසාර පැවැත්මට තුලනය කරනු ලබන මූලාශ්‍රයන්ද වේ. ශ්‍රී ලංකාවේ ජල සම්පත් පරිහරණය කිරීමේ රටාව නිරීක්ෂණය කිරීමේදී මතුපිට ජලාශ හා ජල තලයන් පමණක් නොව භූගත ජල සම්පතේද තිරසාර පැවැත්මට ඉහත සඳහන් මූලාශ්‍ර ආරක්ෂා කර තිබීම පූර්ව අවශ්‍යතාවයකි. නිදසුනක් ලෙස කල්පිටිය අර්ධද්වීපයේ පිහිටි නොගැඹුරු භූගත ජලනිධි වල ධාරිතාවය විශාල ජන සංඛ්‍යාවකගේ පානීය ජල අවශ්‍යතා සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත් වුවද රසායනික පොහොර, කෘෂි රසායන හා පළිබෝධනාශක පසට එකතු වීමෙන් සිදු වී ඇති භූගත ජල දූෂණය හේතුවෙන් මෙම ජලය නැවත පිරිසිදු කළ නොහැකි මට්ටමකට දූෂණය වී ඇත. ජනසංඛ්‍යා ව්‍යාප්තියත්, විවිධ සංකීරණ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා භූමිය භාවිත කිරීමත් හේතුවෙන් භූමියට ඇති වී තිබෙන පීඩනය දිනෙන් දින ඉහළ යමින් පවතී. එය ජල මූලාශ්‍ර වල හා ඒවායේ ප්‍රභව ප්‍රදේශ හා රක්ෂිතවල තිරසාර පැවැත්මට මෙන්ම ජල සම්පත දූෂණය වීමටද සෘජුවම බලපෑම් ඇතිකර තිබේ.

1.9 කෘෂිකාර්මික භූමි පරිභෝගයේ දී නිර්දේශිත ප්‍රමාණ ඉක්මවා රසායනික පොහොර භාවිතා කරනු ලබන නිසාත්. අධික ලෙස කෘෂි රසායන ද්‍රව්‍ය හා පළිබෝධනාශක භාවිතයත් හේතුවෙන් පස දූෂණය වන අතර එහි සෘජු අහිතකර ප්‍රතිඵලයක් ලෙස ජල සම්පත දූෂණය වේ. පානීය ජලයටත් කෘෂිකර්මයටත් ජලය භාවිතා කිරීමේ දැඩි බාධා එල්ල වීම් මේ වන විටත් වාර්තා වී ඇත.

1.10 එමෙන්ම සැළසුම් සහගත නොවන ලෙස ක්ෂුද්‍ර ජලපෝෂක ප්‍රදේශවල වන ආවරණය ඉවත් කර අවිධිමත් ඉදිකිරීම් සිදුකරනු ලබන නිසාත්, අවිධිමත් වගා රටාවන් නිසාත් ජල පෝෂක ප්‍රදේශ සීඝ්‍ර ලෙස හායනයට පත්වෙමින් පවතී. මේ නිසා ගංගා, ඇල, දොළ හා ජලාශවල වාර්ෂික ගැලීම් රටාවන් හෝ ඒවායේ ධාරිතාවන් පහළ වැටීම දක්නට ලැබෙන අතර මේ හේතුවෙන් පානීය ජල ප්‍රශ්නය හා කෘෂිකාර්මික ජල හිඟය ප්‍රමුඛ ගැටළුවක් බටව පත් වී ඇත.

1.11 මේ හැරුණු විට ගංගා, ඇළ, දොළ හා වැව් සහ ජලාශවලට වෙන්කර ඇති රක්ෂිත වල සිදුකරනු ලබන පස්, මැටි හෝ වැලි ඉවත් කිරීම් වැනි කටයුතු ද පතල් කැණීම් ද ජල සම්පත හානියට පත්වීමට දැඩි ලෙස බලපෑම් ඇතිකර තිබේ.

1.12 එපමණක් නොව අවිධිමත් භූමි පරිහරණයන් හේතුවෙන් පොදු පරිහරණයන් සහිත ජල උල්පත්/දිය බුබුළුවල ධාරිතාව අඩු වී විනාශයට යමින් පවතී.

1.13 ඉහල උන්නතාංශ වල පිහිටි ජල පෝෂක ප්‍රදේශ එළිපෙහෙළි කිරීම සහ ජලය හා පස සංරක්ෂණ ක්‍රියාකාරකම් දුර්වල වීමත් නිසා ජල විදුලිය නිපදවන ජලාශ මෙන්ම වාරි ජල පහසුකම් සපයන ජලාශ ද රොන්මඩ වලින් පිරියාමේ තර්ජනයකට අද මෙරට මුහුණ පා සිටී. නිදසුනක් ලෙස රන්ටැඹේ ජලාශය ඉදිකර වසර 09ක් තුළ එහි ධාරිතාවෙන් 38%ක් රොන්මඩ වලින් පිරිගොස් ඇති අතර, පොල්ගොල්ල හා රන්ටැඹේ ජලාශ පිළිවෙලින් වාර්ෂිකව 2.52%කින් සහ 6.95%කින් රොන්මඩ වලින් පිරී යමින් පවතී.

1.14 එමෙන්ම ගෝලීය උෂ්ණත්වය ඉහල යාමත්, ඊට අතිරේක වශයෙන් සිදුවන වෙනත් දේශගුණික විපර්යාස හා ස්වභාවික උපද්‍රව වල ප්‍රතිඵලයක් ලෙස ද ජල මූලාශ්‍ර වලට හානි පැමිණේ. නිදසුන් ලෙස මුහුදු මට්ටම ඉහළ යාම නිසා වෙරළාසන්න ප්‍රදේශවල භූගත ජලයේ ලවණතාවය ඉහළ යාම, සුනාමි ආපදා හේතුවෙන් වෙරළාසන්න ප්‍රදේශ වල සිදුවන පානීය ජල දූෂණය වැනි කරුණු අනාගත ජල සම්පත් සංරක්ෂණ උපාය මාර්ග සැළසුම් කිරීමේදී අවධාරණයට යොමු කළ යුතුව තිබේ.

1.15 එබැවින් ජල මූලාශ්‍ර හා ඒවායේ රක්ෂිත හා ප්‍රභව ප්‍රදේහ ආරක්ෂාව, සංරක්ෂණය හා තිරසාර පැවැත්ම මෙරට සමාජ, ආර්ථික සංවර්ධනය පමණක් නොව පාරිසරික සංතුලනය හා ජෛව විවිධත්වය ආරක්ෂා වීමටද අතිශය වැදගත් සානුබලයක් ලබාදෙනු ඇත.

02. ජල මූලාශ්‍ර සංරක්ෂණය හා ආරක්ෂාව සඳහා මෙතෙක් අනුගමනය කළ උපාය මාර්ග.

2.1 ශ්‍රී ලංකාවේ ජල මූලාශ්‍ර සංරක්ෂණයට අදාළව, නිදහස ලැබීමට පෙර මෙන්ම ඊට පසුව ද බලයට පත් වූ සෑම රජයක් ම විවිධාකාර වූ ප්‍රතිපත්ති හා අණ පණත් හඳුන්වා දී තිබේ. ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණ ජාතික ප්‍රතිපත්තිය, ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය, ජාතික වන ප්‍රතිපත්තිය, ජාතික පාරිසරික ප්‍රතිපත්තිය ඒ අතර ප්‍රධාන වේ.

2.2 වර්ෂ 1930 පමණ සිට සම්මත් වූ අණ පණත්වල ඉඩම් සංවර්ධනය, ජලය හා වනාන්තර සංරක්ෂණය, පාංශු සංරක්ෂණය ආදී විෂයයන් යටතේ ජල මූලාශ්‍ර සංරක්ෂණයට අදාළ නීතිරීති ඇතුළත් කර ඇත. මේ වන විට විවිධ අණ පණත් 40ක පමණ ජල මූලාශ්‍ර සංරක්ෂණයට අදාළ කරුණු ඇතුළත්ව ඇති බව ද පෙනේ. එසේ වුවද එම පනත්වල ක්‍රියාකාරීත්වය පහළ මට්ටමක පවතින අතර සම්පත් හිඟයත් විවිධාකාර වූ තාක්ෂණික හා ආයතනික කරුණුත් මෙයට බලපා තිබේ. එපමණක් නොව එම අණ පණත් මීට දශක කිහිපයකට පෙර සම්මත වූ ඒවා බැවින් වර්තමානයේ පැන නැගී ඇති ගැටළු වලට ස්ථිර සාර විසඳුම් ලබාගැනීමට එම නීති ප්‍රමාණවත් වී නැත.

2.3 එපමණක්ද නොව ජල මූලාශ්‍ර සංරක්ෂණයට අදාළ විවිධ ක්‍රියාකාරකම් වල නිරත ආයතන ගණනාවක්ද පවතින අතර මානව හා භෞතික සම්පත් හිඟයත්, ආයතනික මෙන්ම තාක්ෂණික වශයෙන් පවතින විවිධ සාධක සහ මෙයට සම්බන්ධ අවකාශීය දත්ත ( Spatial Data) හුවමාරු නොවීම සහ හිඟකම හේතුවෙන් ජල මූලාශ්‍ර සංරක්ෂණය හෝ ආරක්ෂා වීම නිසිලෙස සිදු නොවේ. එමෙන්ම විවිධ විදේශ ආධාර වැඩසටහන් මගින්ද ජල පෝෂක ප්‍රදේශ සංකර්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබුවත් එම ව්‍යාපෘති කාල සීමාවෙන් පසුව ඒවා පවත්වාගෙන යාම සිදු නොවීම නිසා අපේක්ෂිත අරමුණු ඉටුවී නැත. එබැවින් ජල මූලාශ්‍ර හා ඒවායේ රක්ෂිත හා පෝෂක ප්‍රදේශ ආරක්ෂාව, සංරක්ෂණය හා තිරසාර කළමනාකරණය සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් සකස් කිරීම කාලීන අවශ්‍යතාවයක් වී තිබේ. එය මෙරට ජනතාවගේ තිරසාර කෘෂිකාර්මික සංවර්ධනය සහ අනාගත පානීය ජල අවශ්‍යතා සපුරාලීමේ තිරසාර වැඩපිළිවලක් පමණක් නොව රටේ නව ආර්ථික ප්‍රතිපත්ති සහ අපේක්ෂා ඉටු කර ගැනීමේ අතිශය සාධනීය ක්‍රියා පිළිවෙතක්ද වනු ඇත.

2.4 මේ සම්බන්ධයෙන් කරුණු විමර්ශනය කර වාර්තා කිරීම සඳහා ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව විසින් 2013.02.07 දින ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ සභාපතිත්වයෙන් පත් කළ අනුකමිටුව විවිධ ආයතනවල සහභාගීත්වයෙන් රැස්වීම් වාර 06ක් සහ වැඩමුළු 02ක් පවත්වා මේ සම්බන්ධයෙන් බලපවත්නා ප්‍රධාන ගැටළු/අවහිරතා 08ක් හඳුනාගන්නා ලදී.

2.5 හඳුනාගන්නා ලද ප්‍රධාන ගැටළු/අවහිරතා

2.5.1 ජල මූලාශ්‍ර ආශ්‍රිත ප්‍රදේශ, ජල මාර්ග රක්ෂිත හා ජලාශ/වැව්වල ජල පෝෂක ප්‍රදේශවල මායිම් හඳුනාගෙන ඒවා භූමියේ සලකුණු කර නොතිබීම.

2.5.2 දැනට පවත්නා නීතිරීති හා අණපනත්වල පවත්නා ගැටළු.

2.5.3 ජල මූලාශ්‍ර සංරක්ෂණය සම්බන්ධයෙන් බලපවත්නා ආයතනික ගැටළු.

2.5.4 ජල මූලාශ්‍ර ආශ්‍රිත ප්‍රදේශ, ජල මාර්ග රක්ෂිත හා ජලාශ/වැව්වල ජල පෝෂක ප්‍රදේශ ආශ්‍රිතව සිදු වන වැරදි ඉඩම් භාවිතයන් හා ජල දූෂණයට බලපාන වෙනත් ක්‍රියාකාරකම්.

2.5.5 ඉහත දක්වන ලද ප්‍රදේශ ආශ්‍රිතව විවිධ කටයුතු සඳහා සිදු කරනු ලබන අනවසර අල්ලා ගැනීම්.

2.5.6 ජල මූලාශ්‍ර සහිත ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා මහජන සහභාගීත්වය මඳ බව.

2.5.7 ජල මූලාශ්‍ර ආශ්‍රිත ප්‍රදේශ, ජල මාර්ග රක්ෂිත හා ජලාශ/වැව්වල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාළ ආයතන සතුව ප්‍රමාණවත් සම්පත් නොමැතිකම.

2.5.8 ඉහත දක්වන ලද ප්‍රදේශවල දැනට සිදු වෙමින් පවතින ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු/දත්ත නොමැතිකම.

ඉහත ගැටළු වලට ස්ථිරසාර විසඳුම් ලැබෙන පරිදි විෂයානුබද්ධ විද්වතුන් සමග සාකච්ඡා කොට විෂය කරුණු පිළිබඳව එකඟත්වයකට එළැඹී අතර එම පදනම මත පිහිටා මෙම ප්‍රතිපත්තිය සකස්කර තිබේ.

03. ප්‍රතිපත්ති දැක්ම (Policy Vision)

"මතු පරපුර වෙනුවෙන් ජල සම්පත"

04. ප්‍රතිපත්ති ඉලක්කය (Policy Goal)

ප්‍රශස්ථ කළමනාකරණයක් තුළින් ශ්‍රී ලංකාවේ සියළුම ජල මූලාශ්‍ර හා ඒවායේ ප්‍රභව ප්‍රදේශ ආරක්ෂාව හා සංරක්ෂණය තහවුරු කිරීම මෙම ප්‍රතිපත්තියේ මූලික අපේක්ෂාව වේ.

05. ප්‍රතිපත්ති අරමුණ (Policy Objective)

ශ්‍රී ලංකාවේ ජල මූලාශ්‍ර වල පැවැත්ම තහවුරු කිරීම හා ප්‍රවර්ධනය සඳහා සියලුම ජල මූලාශ්‍ර, ඒවායේ ප්‍රභවයන්, ඊට අයත් රක්ෂිත ප්‍රදේශ, සංරක්ෂිත බිම් හා ආසන්නතම පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම මෙම ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ වේ.

06. ප්‍රතිපත්ති මූලධර්ම (Policy Elements)

6.1 පොදුවේ සලකා බැලීමේ දී ශ්‍රී ලංකාවට, ජලය හිඟ සම්පතක් නොවේ. එහෙත් ජල සම්පත්වල අසමාන භූගෝලීය ව්‍යාප්තියත්, වර්ෂාපතන රටාවේ විචල්‍යතාවය පමණක් නොව ජල භාවිතයේ විෂමතා ද හේතුවෙන් ජලය හිඟ සම්පතක් පමණක් නොව එයට විශාල ආර්ථික වටිනාකමක්ද ලැබී තිබේ. එම නිසා ජලය "භාවිතයෙන් අවසාන නොවන" සම්පතක් වුවත් එහි තිරසාර පැවැත්ම තහවුරු නොකළහොත් අනිවාර්යයෙන්ම අහිතකර සමාජ, ආර්ථික මෙන්ම පාරිසරික ප්‍රතිවිපාකද අත්විඳීමට සිදුවනු ඇත.

6.2 එබැවින් ජල මූලාශ්‍ර සංරක්ෂණය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වූ මෙම ප්‍රතිපත්තිය පහත සඳහන් මූලධර්මයන් මත පිහිටා සකස්කර ඇත.

6.2.1 ශ්‍රී ලංකාවේ සියලුම ජල මූලාශ්‍ර මිල කළ නොහැකි පොදු සම්පතක් මෙන්ම ගෝලීය වත්කමක් (Global Asset) ලෙස සලකා කටයුතු කිරීම.

6.2.2. මානව වර්ගයාගේත්, පරිසරයේත් යහපැවැත්ම උදෙසා පිරිසිදු ගුණාත්මක බවකින් යුත් ජලය ලබාගැනීමේ සහ පරිහරණය කිරීමේ අයිතිය ජනතාව සතුව පවතී.

6.2.3 පොදු මහජන පරිහරණයේදීත් විවිධ සංවර්ධන කටයුතු ඇතුළු අනෙකුත් සියළු ආකාරයේ භාවිතයන්වලදීත් ජල සම්පතේ තිරසාර පැවැත්ම තහවුරු කිරීම සියළු ජන කොටස්වලත් වගකීම් භාර ආයතනවලත් කාර්යභාරය වේ.

6.2.4 ජල සම්පතේ මතු ආරක්ෂාව හා ගුණාත්මක භාවය රැකීම සඳහා ජල මූලාශ්‍ර හා ඒවායේ ප්‍රභව ප්‍රදේශ ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම සෑම පුරවැසියෙකුගේම පොදු වගකීමක් වන්නේය.

6.2.5 ස්ථානීය පිහිටීම හෝ අයිතියේ ස්වභාවය නොසලකා ජල මූලාශ්‍ර හා ඒවායේ ප්‍රභව ප්‍රදේශ ආරක්ෂාව හා සංරක්ෂණය කළයුතු වන්නේය. අයිතිය ස්වභාවය අනුව සංරක්ෂණ උපාය මාර්ග හා යාන්ත්‍රණය සකස් කරනු ඇත.

6.2.6 සෑම මට්ටමකම ජලය භාවිතා කරන්නන්, සැළසුම්කරුවන් සහ ප්‍රතිපත්ති තීරණ ගනු ලබන පුද්ගලයින් හා ආයතන, සහභාගීත්ව සැළසුම්කරණ ප්‍රවේශයක් මගින් ජල මූලාශ්‍ර ආරක්ෂා කිරීමට, සංරක්ෂණය හා කළමනාකරණයට දායක වියයුතු වන්නේය.

6.2.7 රජයේ ඉඩම්වල පිහිටි සහ ඉඩම් ප්‍රතිසංස්කරන කොමිෂන් සභාව සතු ඉඩම්වල පිහිටි ජල මූලාශ්‍ර සම්බන්ධයෙන් දැනට පවතින නීතිරීති අනුව කටයුතු කරනු ලැබේ.

6.2.8. වැවිලි සමාගම් සතු ඉඩම් වල සහ පෞද්ගලික ඉඩම්වල පිහිටි ජල මූලාශ්‍ර සම්බන්ධයෙන් සහභාගීත්ව කළමණාකරන ක්‍රමවේදය ඔස්සේ එම ජල මූලාශ්‍ර සංරක්ෂණය හා සංවර්ධනය කිරීමට අවශ්‍ය අවස්ථාවක පමණක් පාරිසරික සංවේදී කලාප වශයෙන් ජාතික පාරිසරික පනත අනුව ප්‍රකාශයට පත් කිරීමට හෝ රජයට අත්පත් කර ගැනීමට අපේක්ෂා කෙරේ.

07. ප්‍රතිපත්ති (Policies)

මෙම ප්‍රතිපත්තියේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමේ දී එම ප්‍රතිපත්තිමය කරුණු ක්‍රියාත්මක ස්වරූපය අනුව විවිධ විෂය ක්ෂේත්‍රවලට සම්බන්ධ වී පවතින බව පෙනී යයි. ඒ අනුව සමස්ත ප්‍රතිපත්තිය පහත සඳහන් විෂයයන් යටතට ගෙන ඉදිරිපත් කරනු ලැබේ.

7.1 ජල මූලාශ්‍ර හඳුනා ගැනීම, සීමා නිර්ණය කිරීම, මායිම් සළකුණු කිරීම, ආරක්ෂාව හා සංරක්ෂණය.

7.2 ජල මූලාශ්‍ර සංරක්ෂණය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වූ ආයතන සවිබල ගැන්වීම.

7.3 ක්‍රියාකාරකම් මෙහෙය වීම හා පසු විපරම් කටයුතු.

7.4 දැනුවත් කිරීම් හා සහභාගීත්වය ලබා ගැනීම.

7.5 මූල්‍ය ප්‍රතිපාදන සහ පහසුකම් සැලසීම.

ඉහත විෂය කරුණු 05ට අදාළ ප්‍රතිපත්තීන් පහත දැක්වේ.

08. ජල මූලාශ්‍ර සහ ඒ ආශ්‍රිත ප්‍රදේශ හඳුනා ගැනීම, මායිම් සළකුණු කිරීම, ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම සඳහා වූ ප්‍රතිපත්ති

8.1 ජල මූලාශ්‍ර සහ ඒවායේ ප්‍රභව ප්‍රදේශ සහ ඒ ආශ්‍රිත ප්‍රදේශවල සීමාවන්/මායිම් නිර්නය කිරීම එම මායිම් සළකුණු කිරීම සහ නීත්‍යානුකූල ලෙස ප්‍රකාශයට පත් කිරීම.

8.2 ජල මූලාශ්‍ර සහ ඒවායේ ප්‍රභව ප්‍රදේශ රක්ෂිත ආශ්‍රිතව සළකුණු කරන ලද ප්‍රදේශවල ඉඩම්, ඒවායේ වර්තමාන අයිතිය හා භාවිතය සලකා බලා ඊට අනුකූල උපාය මාර්ග අනුව සංරක්ෂණය කිරීම.

8.3 ඉඩම් පරිහරන සැළසුම් සැකසීම මගින් ජල මූලාශ්‍ර ආශ්‍රිත ප්‍රදේශයන්හි අවිධිමත් භාවිතයන් වැළැක්වීම.

8.4 ජල මූලාශ්‍ර ආශ්‍රිත ප්‍රදේශයන්හි හායනයට පත්ව ඇති ඉඩම් පුනරුත්ථාපනය කිරීම.

8.5 ජල මූලාශ්‍ර ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ඇති අණපණත් වලට සංශෝධන අවශ්‍ය වන්නේ නම් ඒවා හඳුනා ගැනීමත් නව නීති අවශ්‍ය වන්නේ නම් ඒවා පැනවීමත් සිදු කිරීම.

8.6 ප්‍රාදේශීය සංවර්ධන සැළසුම් ඇතුළුව සියළු සංවර්ධන සැළසුම් පිළියෙල කිරීමේදී ජල මූලාශ්‍ර ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම පිළිබඳව විශේෂ අවධානය යොමු කිරීම සහ එම යෝජනා සංවර්ධන සැළසුම්වලට ඇතුළත් කිරීම.

8.7 ජල මූලාශ්‍ර ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීම සහ සංරක්ෂනය කිරීම සඳහා පාරිසරික සංවේදී ප්‍රදේශ සහ මුහුදු මට්ටමේ සිට අඩි 5000ට උසින් වූ බිම් සඳහා සංරක්ෂණය ප්‍රමුඛ කරගත් යෝග්‍ය ඉඩම් පරිහරණයන් අනිවාර්ය කිරීම.

8.8 ජල මූලාශ්‍ර ආශ්‍රිත ප්‍රදේශවල සංරක්ෂණය සඳහා හඳුනාගනු ලැබූ රජයේ ඉඩම් සංරක්ෂණය ප්‍රමුඛ කරගත් කටයුතු සඳහා හැර වෙනත් කටයුතු සඳහා නිදහස් නොකිරීම.

8.9 ජල මූලාශ්‍ර ආශ්‍රිත ප්‍රදේශ කළමනාකරණය සඳහා සාකල්‍ය ප්‍රවේශයක් (Holistic Approach) අනුමගනය කිරීම.

09. ආයතන සවිබලගැන්වීම සඳහා වූ ප්‍රතිපත්ති

9.1 ජල මූලාශ්‍ර ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීම හා සංරක්ෂණය හා කළමනාකරණය සම්බන්ධව ඍජුව හා වක්‍රව දායක වන ආයතන හඳුනා ගැනීම. (1 - උපලේඛනය පරිදි)

9.2 ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි එම ආයතනවල මානව හා භෞතික සම්පත් වැඩිදියුණු කිරීම.

9.3 සියලු වගකීම් දරන ආයතන විසින් තම වාර්ෂික ක්‍රියාත්මක සැලසුම්වලට ජල මූලාශ්‍ර ආරක්ෂාව හා සංරක්ෂණයට අදාළ ක්‍රියාකාරකම් ඇතුළත් කිරීම.

9.4 ජල මූලාශ්‍ර ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීම, සංරක්ෂණය සහ කළමනාකරණය වෙනුවෙන් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා ඒ සම්බන්ධ විශේෂඥයින්ගෙන් සැදුම්ලත් ජාතික මට්ටමේ මෙහෙයුම් කමිටුවක් ස්ථාපිත කිරීම.

10. මෙහෙය වීම හා පසු විපරම් කටයුතු පිළිබඳ ප්‍රතිපත්ති

10.1 ජල මූලාශ්‍ර ආශ්‍රිත ප්‍රදේශවල සිදු කරනු ලබන අනවසර හා හානිකර ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු අදාළ බළධාරි අයතනවලට දැනුම්දීමේ ක්‍රමයක් ස්ථාපිත. කිරීම හා ඒ පිළිබඳව ක්‍රියාත්මක යාන්ත්‍රණය සවිබල ගැන්වීම.

10.2 ජල මූලාශ්‍ර ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම සම්බන්ධයෙන් වූ සියලු කටයුතු පසු විපරම් කිරීම සඳහා පසු විපරම් කිරීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

10.3 ජලාශ හා ඒවාගේ මූලාශ්‍ර වල ජලයේ ප්‍රමාණය හා ගුණත්වය පිළිබඳ නිරන්තරයෙන් පරීක්ෂා කිරීම හා දෝෂ පිළිබඳ පෙර අනතුරු ලබා දීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම.

10.4 ජල මූලාශ්‍ර ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම පහසු කරනු සඳහා තොරතුරු පද්ධතියක් සංවර්ධනය කර පවත්වා ගෙන යනු ලබන අතර එය 2013.08.07 වැනි දින ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අවකාශීය දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීමට අදාළ ආමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් දත්ත පද්ධතියට ඒකාබද්ධ කිරීම.

10.5 දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ පළාත් පාලන ආයතන හා අනෙකුත් ආයතන ව්‍යුහයන් හරහා ජල මූලාශ්‍ර ආරක්ෂාව, සංරක්ෂණය හා කළමනාකරණය පිළිබඳ දත්ත හා තොරතුරු හුවමාරුව සිදු කිරීම.

11. දැනුවත් කිරීම සහ සහභාගීත්වය ලබා ගැනීම සම්බන්ධ ප්‍රතිපත්ති

11.1 ජල මූලාශ්‍ර ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය සඳහා පාර්ශවකරුවන්ගේ සහ ප්‍රජාවගේ සහභාගීත්වය දිරිගැන්වීම.

11.2 ජල මූලාශ්‍ර ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීමේ සහ සංරක්ෂණය කිරීමේ වැදගත්කම පිළිබඳව මහජනතාව ඇතුළු සියලු පාර්ශවකරුවන් සහ විධිමත් විෂය මාලාව යටතේ සිසුන් දැනුවත් කිරීම සඳහා පියවර ගැනීම.

11.3 ජල මූලාශ්‍ර ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය සඳහා පාරම්පරික දැනුම සහ එම ක්‍රම භාවිතා කිරීමට පියවර ගැනීම.

11.4 ජල මූලාශ්‍ර ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය සඳහා පුද්ගලික අංශයේ සහභාගිත්වය දිරිගැන්වීම හා රජය හා පෞද්ගලික අංශය ඒකාබද්ධ ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

11.5 ජල මූලාශ්‍ර ප්‍රදේශ ආරක්ෂාව හා සංරක්ෂණය සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයතන ඒකාබද්ධ ව වැඩසටහන් (Public Private partnership - PPP) දිරිගැන්වීම හා ඒකාබද්ධ සමාජ වගකීම් (Co-oporate Social Responsibility - CSR) අනුව කටයුතු කිරීම.

11.6 ජල මූලාශ්‍ර ආරක්ෂාව හා සංරක්ෂණයට සෘජුවම දායක වන අධ්‍යයන හා පර්යේෂණ සඳහා දිරිගැන්වීම.

12. මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමේ යාන්ත්‍රණය පිළිබඳ ප්‍රතිපත්ති

12.1 ජල මූලාශ්‍ර ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා වන සැළසුම් සඳහා ජාතික අයවැයෙන්, පළාත් සභා අරමුදල් වලින් සහ පළාත් පාලන අරමුදල්වලින් අදාළ සියලු රාජ්‍ය ආයතන වෙත අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම.

12.2 රාජ්‍ය මූල්‍ය ප්‍රතිපාදන මත, පුද්ගලික අරමුදල් මත සහ විදේශාධාර යටතේ ක්‍රියාත්මක ජලය සම්බන්ධ ව්‍යාපෘති සඳහා යෙදවෙන අරමුදල් වලින් කොටසක් ජල මූලාශ්‍ර ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා යෙදවීමට පියවර ගැනීම.

13. ක්‍රියාත්මක යාන්ත්‍රණය (Operational Mechanism)

13.1 මෙම ප්‍රතිපත්තියේ ඉහත විෂය කරුණු විශ්ලේෂණය කිරීමේ දී විෂය ක්ෂේත්‍ර ගණනාවක් යටතේ ආයතන කිහිපයකට ම එය ක්‍රියාවට නැංවීමේ වගකීම පැවරෙනු ඇත. ප්‍රධාන වශයෙන් ඉඩම්, ජල සම්පත්, වාරි මාර්ග, මහවැලි, කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, වනජීවි හා වන සංරක්ෂණ හා පරිසර හා අධ්‍යාපන යන ක්ෂේත්‍ර මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ පුරෝගාමී විෂය භාර ආයතන වේ. මේ හැරුණු විට පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලනයත් ඊට සමබන්ධ සියලුම විෂයානුබද්ධ ආයතනික ව්‍යුහයන් මෙම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ ප්‍රධානතම පාර්ශවකාර ආයතනයන් වේ. එසේම මෙම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ දී සම්බන්ධීකාරක ආයතනය ලෙස ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ වූ ඉඩම් පරිහරන ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තු කටයුතු කරනු ඇත. මෙම දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණය යටතේ පහත සඳහන් ආයතනවලින් සමන්විත මෙහෙයුම් කමිටුවක් ක්‍රියාත්මක කරනු ලබන අතර එම ආයතන මෙම ප්‍රතිපත්තිය බලාත්මක කිරීමේ ආයතන ලෙස සළකනු ලැබේ.

මෙම ආයතන විසින් තම වගකීම් දරන ජල මූලාශ්‍ර සංරක්ෂණයට අදාළ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා සංයුක්ත සැළසුම් සහ උපාය මාර්ගික සැළසුම් හා ඊට අනුකූල ක්‍රියාත්මක සැළසුම් සකස් කළ යුතුය.

* ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය
* පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය
* වැවැලි කර්මාන්ත අමාත්‍යාංශය
* ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශය
* වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය
* පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය
* අධ්‍යාපන අමාත්‍යාංශය
* ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුව
* ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
* මිනින්දෝරු දෙපාර්තමේන්තුව
* ජල සම්පත් මණ්ඩලය
* ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
* ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
* වාරිමාර්ග දෙපාර්තමේන්තුව
* කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
* වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
* වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
* මධ්‍යම පරිසර අධිකාරිය
* ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
* ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ මණ්ඩලය
* නාගරික සංවර්ධන අධිකාරිය
* ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
* ජාතික භෞතික සැළසුම් දෙපාර්තමේන්තුව

14. මෙහෙයුම් කමිටුවේ නිර්ණේය විෂයයන් (Terms of References of the Operational Committee/National Expert Committee)

මෙම ප්‍රතිපත්තියේ ඵලදායි හා කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය තහවුරු කරනු වස් ඉහත සඳහන් මෙහෙයුම් කමිටුවට මෙහි පහත දැක්වෙන නිර්ණේය විෂයය (TOR) පැවරෙනු ඇත.

14.1 සියලුම ආකාරයේ ජල මූලාශ්‍ර, ජල උල්පත් හා ගංගා, ඇළ, දොළ රක්ෂිත හා ප්‍රමුඛතා අනුව ජලාශ රක්ෂිත හඳුනා ගැනීම හා ඒවා විස්තරාත්මක සිතියම් වල ලකුණු කිරීම.

14.2 ඉහත තොරතුරු ඇතුළත් භූගෝල විද්‍යාත්මක දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම හා ඒවායේ තොරතුරු අදාළ ආයතන වල භාවිතයට ඉඩ සැලසීම.

14.3 සංරක්ෂණය හා ආරක්ෂා කළයුතු ජල මූලාශ්‍ර, ජල උල්පත් හා ඒවායේ රක්ෂිත ප්‍රදේශ හා ගංගා, ඇළ, දොළ රක්ෂිත පිහිටීම මැන සළකුණු කිරීම.

14.4 සංරක්ෂණය හා ආරක්ෂා කළ යුතු ජල මූලාශ්‍ර, ජල උල්පත් හා ඒවායේ රක්ෂිත ප්‍රදේශ හා ගංගා, ඇළ, දොළ සංරක්ෂණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීම.

14.5 පවත්නා නීති රීති හා අණ පණත් අදාළ කරගෙන ගංගා, ඇළ, දොළ හා ජලාශ රක්ෂිතවල දැනට පතින අනවසර අල්ලා ගැනීම් හා භාවිතයන් ඉවත් කිරීමට කටයුතු කිරීම.

14.6 ගංගා, ඇළ, දොල හා ජලාශ රක්ෂිත හා අනෙක් ජල මූලාශ්‍ර සංරක්ෂණය හා ආරක්ෂාව සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි අනෙකුත් නීතිරීති කෙටුම් පත් කිරීම. (උපලේඛනය 02 අනුව) හා නව ජාතික ප්‍රතිපත්තියක් කෙටුම්පත් කිරීම.

14.7 සියලුම ආකාරයේ ජල මූලාශ්‍ර, ජල උල්පත් හා ගංගා, ඇළ, දොල රක්ෂිත ප්‍රදේශ වල සහ ඒවායේ පෝෂක ප්‍රදේශ සඳහා ඉඩම් පරිහරන සැළසුම් සැකසීම.

14.8 ජල මූලාශ්‍ර සංරක්ෂණය සම්බන්ධයෙන් මාධ්‍ය වැඩසටහන්, විෂය මාලා සංවර්ධන කටයුතු, දැනුවත් කිරීම, අධ්‍යාපනික වැඩසටහන් සැකසීම හා ක්‍රියාත්මක කිරීම.

**උපලේඛනය - 01**

ප්‍රධාන ගංගා, අතු ගංගා, පහත් බිම් ප්‍රදේශ ජලාශ/වැව් ඇළ මාර්ග සහ බස්නා ඇළවල් වල පිහිටීම හා ස්වභාවය අනුව ඒවා ආරක්ෂා කිරීම පහත සඳහන් ආයතන වෙත පවරා දීම සුදුසු බව යෝජනා කෙරේ.

| | *වගකීම් දරණ ක්ෂේත්‍රය* | *මූලික වගකීම දරන ආයතනය* |
|---|---|---|
| I. | ප්‍රධාන ගංගා හා එම ගංගා වලට එක්වන ප්‍රධාන අතු ගංගාවල කොටස් | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| II. | සියළු ගංගා වල වෙරළ ආශ්‍රිත මෝයවල්, කලපු, ස්වභාවික ජල විහිදුම් ප්‍රදේශ | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| III. | මධ්‍යම ආණ්ඩුව යටතට ගැනෙන සියළුම ප්‍රධාන ජලාශ හා වැව්වල ඉහළ හා පහළ රක්ෂිත ප්‍රදේශ එම ඇළ මාර්ග හා බස්නා ඇළවල් - එම ජලාශ වල නඩත්තු හා මෙහෙයුම් කටයුතු | වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය, විදුලිබල මණ්ඩලය, ජලසම්පාදන හා ජලපවාහන මණ්ඩලය. |
| IV. | ගංවතුර තත්වයට මුහුණ දෙන ප්‍රදේශවල සියළු බස්නා ඇළ පද්ධති හා අවසානයේදී එම පද්ධති සම්බන්ධවන ගංගාද සමග වෙරළ දක්වා කොටස් | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| V. | ඉහත කී (ඇ) අනු ඡේදය ඇතුළත් නොවන මධ්‍යම ආණ්ඩුව යටතේ ඇති සියළු ප්‍රධාන වැව් හා මධ්‍යම ප්‍රමාණයේ වැව් හා ඊට අනුබද්ධ ඇළ මාර්ග හා බස්නා ඇළවල් | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| VI. | මධ්‍යම ආණ්ඩුව යටතට නොගැනෙන වගා ප්‍රදේශයේ අක්කර 200ට වැඩි වැව් හා ඊට සම්බන්ධ සියළු ඇළ මාර්ග හා (1) ට අයත් නොවන සියළුම ගංගා කොටස් | පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව හෝ එය නිසි පරිදි ක්‍රියාත්මක නොවේනම් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව |

| වගකීම් දරණ ක්ෂේත්‍රය | මූලික වගකීම දරන ආයතනය |
|---|---|
| VII. (III. IV. V')ට අයත් නොවන සියළු වැව් හා ඒවායේ ඇළ මාර්ග හා (II) හා (V) හා (VI)ට ඇතුළත් නොවන සියළු ඔයවල් හා දිය පාරවල් | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව |
| VIII. වැසි ජලය ගලා ගොස් දියපහර වල් තැනෙන ප්‍රාදේශීය වශයෙන් කුඩා උස් බිම් අතර පිහිටි සියලු කාණු හා බස්නා පද්ධති | ප්‍රාදේශීය ලේකම් |
| IX. පහත් බිම් ආශ්‍රිත ඇළ මාර්ග පද්ධති හා එම ප්‍රදේශවල ගංවතුර පාලනය සම්බන්ධ ක්‍රියාකාරකම් | ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මණ්ඩලය |
| X. වනජීවී රක්ෂිත, වන රක්ෂිත සහ පරිසර ආරක්ෂක ප්‍රදේශ තුළ පිහිටි ජල මූලාශ්‍ර සංරක්ෂණය කිරීම හා ආරක්ෂා කිරීම පිළිබඳ කටයුතු | වන සංරක්ෂණ දෙපාරත්මේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය සහ අනිකුත් පාර්ශවකාර ආයතන |
| XI. භූගත හෝ භූතල ජල සම්පත් (උල්පත් හා බුබුළු - Springs & Sprouts) පානීය ජල ව්‍යාපෘති සහ හෝ කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා කිරීම | ජල සම්පත් මණ්ඩලය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් ඇතුළු විෂය භාර අනිකුත් ආයතන |

## උපලේඛනය - 02

ජල මූලාශ්‍ර සංරක්ෂණය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වඩාත් හොඳින් කටයුතු කළ හැකි වන පරිදි සංශෝධනය විය යුතු යැයි විෂය කමිටුව විසින් සඳහන් කරන ලද අණපනත් වල නාම ලේඛනය.

I. රජයේ ඉඩම් ආඥාපනත ;
II. ඉඩම් සංවර්ධන ආඥාපනත ;
III. වාරිමාර්ග ආඥාපනත ;
IV. ගොවිජන සංවර්ධන පනත ;
V. ජල සම්පත් මණ්ඩල පනත ;
VI. කැලෑ ආඥාපනත ;
VII. වන ජීවී ආරක්ෂණ පනත ;
VIII. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත ;
IX. පාංශු සංරක්ෂණ පනත ;
X. ආපදා කළමනාකරණ පනත ;
XI. වෙරළ සංරක්ෂණ පනත ;
XII. නාගරික සංවර්ධන අධිකාරී පනත ;
XIII. ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය ;
XIV. තේ/රබර්/පොල් ඇතුළු වැවිලි භෝග සම්බන්ධ පනත් ;
XV. මහවැලි අධිකාරී පනත

01 - 219

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

2 - PG 2298